# ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

## ඉංජිනේරු තාක්ෂණ පීඨය

## රෙදිපිළි සහ ඇඟලුම් තාක්ෂණ දෙපාර්තමේන්තුව

අධ්‍යයන වැඩසටහන: කර්මාන්ත අධ්‍යයනය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව

| | |
|---|---|
| විභාගයේ නම | : අවසාන වාර විභාගය |
| පාඨමාලා කේතය | : **TAI2289 විලාසිතා හඳුන්වා දීම** |
| අධ්‍යයන වර්ෂය | : **2019/20** |
| දිනය | : **24 ජූලි 2020** |
| වේලාව | : 14:00 - 17:00 |
| කාලය | : පැය තුනයි |

**සාමාන්‍ය උපදෙස්**

1. ප්‍රශ්නවලට පිළිතුරු දීමට පෙර සියලු උපදෙස් හොඳින් කියවන්න.
2. මෙම ප්‍රශ්න පත්‍රය පිටු හතරක (04) ප්‍රශ්න හතකින් (07) සමන්විත වේ.
3. පිළිතුරු පත්‍ර පිටු සියල්ලෙහිම ඔබේ විභාග අංකය සටහන් කරන්න .
4. **අනිවාර්ය වන ප්‍රශ්න අංක එක (01) සහ වෙනත් ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න. සියලුම ප්‍රශ්න සමාන ලකුණු (ලකුණු 20) දරයි.**
5. සෑම ප්‍රශ්නයකටම පිළිතුර නව පිටුවකින් ආරම්භ කළ යුතුය. **ප්‍රශ්නයකට බොහෝ කොටස් තිබේ නම්, සියලුම කොටස් එකම ප්‍රශ්නය යටතේ අනුක්‍රමික පිළිවෙලට පිළිතුරු දිය යුතුය.**
6. පිළිතුරු පොතේ පිළිතුරු ප්‍රශ්න අංක ලියන්න.
7. මෙය සංවෘත පොත් පරීක්ෂණයකි (CBT).
8. පිළිතුරු පැහැදිලි අත් අකුරින් විය යුතුය.
9. රතු පාට පෑන් භාවිතා නොකරන්න.

01. <u>අනිවාර්ය ප්‍රශ්නය</u>

a) "වර්ණ" විස්තර කිරීමේදී යොදා ගන්නා ගුණාංග තුනක් (03) නම් කරන්න. (ලකුණු 03)

b) නිර්මාණයක් ගොඩනැමේදී පාදකකොට ගන්නා මූලධර්ම තුනක් (03) නම් කරන්න. (ලකුණු 03)

c) විලාසිතා නිදර්ශන (Fashion illustration) නිර්මාණයේදී භාවිතා කෙරෙන නිදර්ශන ක්‍රම තුනක් (03) සඳහන් කරන්න. (ලකුණු 03)

d) විලාසිතා අනුවර්තනයේදී සඳහන් කෙරෙන "පාරිභෝගිකයන් වර්ග" හතරක් (04) නම් කරන්න. (ලකුණු 04)

e) මධ්‍යකාලීන වික්ටෝරියානු යුගයේදී විලාසිතා ලෝකයට බලපෑමක් ඇතිකළ ප්‍රධාන කරුණු දෙකක් (02) සඳහන් කරන්න. (ලකුණු 02)

f) 20 වන ශතවර්ෂයට අයත් විලාසිතා උප සංස්කෘතීන් වර්ග තුනක් (03) සඳහන් කරන්න. (ලකුණු 03)

g) ජපන් විලාසිතා නිර්මාණ ශිල්පී, ඉසී මියාකේ (Issey Miyake) විසින් නිර්මාණය කරන ලද විලාසිතා එකතුන් දෙකක් (02) නම් කරන්න. (ලකුණු 02)

<u>පහත සඳහන් ප්‍රශ්න හයෙන් (06) ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න</u>

02. a) "නිශ්චිත වෙළඳපලක්" සහ "පාරිභෝගික හැසිරීම" අවබෝධ කර ගැනීමට අවශ්‍ය කෙරෙන ලක්ෂණ දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 06)

b) විලාසිතා වෙළඳපල මට්ටම් ගැන සඳහන් කරන "නිර්මාණකරු ලේබලය (Designer label)" ඇඟලුම් කාණ්ඩය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

c) විලාසිතා නිෂ්පාදන චක්‍රයේ (Fashion product life cycle) "පිරිහීමේ අවධිය (Decline stage)" කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

d) ඇඳුමින් සිදුවන කාර්යයන් තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. a) මුල් වික්ටෝරියානු යුගයේදී කැපීපෙනෙන ලෙස ගොඩනැගුන විලාසිතාවන් තුනක් (03) කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

b) මුල් මධ්‍යකාලීන යුගයට අයත් "දාසයන්ගේ" ඇඳුම්වල පැවති ලක්ෂණ තුනක් (03) පිළිබඳ කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

c) 1960 දශකවානුවේදී සිදු වූ බටහිර විලාසිතා සංචලනවලට අයත් (Western fashion movements) කරුණු හතරක් (04) පිළිබඳ කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

04. a) 20 වන ශතවර්ෂයේ අගභාගයට අයත්ව ගොඩනැගුණු "පන්ක් විලාසිතා (Punk style)" හි ලක්ෂණ හතරක් (04) කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

b) 20 වන ශතවර්ෂයේ මැද භාගයේදී දක්නට ලැබෙන "ස්කින් හෙඩ් (Skin head)" විලාසිතාවට අයත් ලක්ෂණ දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 06)

c) ක්‍රිස්ටියන් ඩියෝ (Christian Dior) විසින් නිර්මාණය කරන ලද "නව පෙනුම (New Look)" විලාසිතා එකතුවෙහි දක්නට ලැබෙන ලක්ෂණ තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

05. a) නිර්මාණ සංක්ෂිප්තයක් (Design brief) ගොඩනැගීමේදී මූලික වශයෙන් විමර්ශනය (Investigation) කළ යුතු කරුණු තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

b) නිර්මාණයක් ගොඩනැගීමේදී සැලකිල්ලට ගන්නා "ආකෘතිය (Form)" යන පදය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

c) නිර්මාණයක් ගොඩනැගීමේදී එතුලින් "පර්යාවලෝකනය/දෘෂ්ටිය (perspective look)" පෙන්විය හැකි ක්‍රම තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 09)

06. a) වර්ණ න්‍යායන්ට මූලිකව අයත්වන "තීව්‍රතාව (Intensity)" යන පදය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

b) "ආකලන වර්ණ (Additive colours)" පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

c) වර්ණ චක්‍රයට (Colour wheel) අයත් වූ වර්ණ පටිපාටින් තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 09)

d) "ව්‍යකලන වර්ණ (Subtractive color)" මිශ්‍ර කිරීමේ දී භාවිතයට ගැනෙන ක්‍රම දෙකක් (02) පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 04)

07. පහත සඳහන් ඕනෑම හතරකට (04) කෙටි සටහන් ලියන්න. (ලකුණු 20)

a) ඇන්ටෝනියෝ ලෝපෙස්

b) ස්ටෙලා මැකාර්ට්නි

c) රාජකාරී විලාසිතා යුගය

d) හොවුට් කුතුර් (Haute couture)

e) පුරාණ ග්‍රීසියේ ඇඳුම්වල විලාසිතා ලක්ෂණ

f) යට ඇඳුම් (Intimate apparel)